# නපුරු වෘකයා සහ නුවණක්කාර එළු අම්මා



එකෝමත් එක කාලෙක එළු අම්මයි එයාගෙ පුංචි පැටවු හත් දෙනායි කැලේ කුඩා නිවසක වාසය කළා.

හැමදාම එයාගෙ පැටවුන්ට කෑම හොයන්න උදෙන්ම කැලේ ඈතට යන්න මේ එළු අම්මා පුරුදු වෙලා සිටියා.

මේ කැලයේ නපුරු වෘකයෙක් ඉන්න බවත් උගෙන් මේ පුංචි පැටවු ආරක්ෂා කරගන්න එක ගැන එළු අම්මා නිතරම වද වෙනවා.

ඒ නිසා හැමදාම ගෙදරින් පිට වෙන්න කලින් මේ එළු අම්මා පුංචි පැටවුන්ට කියනවා කවුරු ඇවිත් දොරට තට්ටු කලත් දොර අරින්න එපා, මොකද මේ කැලේ ඉන්නව නපුරුම නපුරු වෘකයෙක් ඒ වෘකයා පුංචි ඔයාලව දඩයන් කරන්න මාන බලා ගෙන ඉන්නවා, ඒ නිසා පරිස්සමින් ගේ ඇතුලටම වෙලා ඉන්න කියා....



ඉතින් මේ කියන දවසේ එළු අම්මා ඈතට යනවා බලන් හිටිය වෘකයා හෙමින් හෙමින් මේ නිවස අසලට ඇවිත් දොරට තට්ටු කළා...

ඉන්පස්සෙ වෘකයා කියනවා "දරුවනේ මම අම්ම ඇවිත් ඉන්නෙ, දොර අරින්න දරුවනේ....."

නමුත් ඒ හඩ හරිම රළුයි...ඒ නම් අම්ම වෙන්න බැහැ.... එහෙම හිතුව පැටවු ටිකට එළු අම්මා කීව අවවාද මතක් වුනා...

බිය වූ පුංචි පැටවු ටික දොර නම් ඇරියෙ නෑ....

ඉතින් කිසිම හැල හොල්මනක් නැතුව ටික වෙලාවක් ගත වුනා.

ටික වේලාවකට පසු නැවතත් දොරට තට්ටු කරන හඩක් .....

අනේ පුංචි පැටවුන්ට හිතුනා ඒ ආවෙ එළු අම්මාද කියලා.

මොකද ඒ සැරේ නම් මෘදු කටහඩක් තමයි පැටවුනට ඇහුනෙ...

ඒත් නැවතත් අම්ම ගෙ අවවාද මතක් වූ නිසා දොර ඇරියෙ නෑ...

ඉතින් පැටවු කියනවා ඔය නම් අපේ අම්ම වෙන්න බැහැ කියලා...

වෘකයත් නිකන් හිටියෙ නෑ.... මාව හඳුනන්න බැරිද මගේ දරුවනේ.....

ඕන්න එහෙනම් ඔය කවුළුව පොඩ්ඩක් අරින්න....

ඔයාල මගේ අත් දෙක අතගාල බලන්න කීවා....

ඉතින් පුංචි පැටවු කවුළුව ඇරලා වෘකයා කී පරිදි වෘකයෙගෙ අත් දෙක අතගාලා තේරුම් ගත්තා මේ නම් වෙන කවුරුවත් නෙමෙයි...

අපේ අම්ම තමයි කියලා සතුටින් දොර ඇරියා......

අනේ මෙන්න නපුරු වෘකයා පැනපු ගමන්ම ලොකුම පැටියව එක වරම ගිල්ලා....කුඩා පැටියා හැර අනෙත් හයදෙනාම තමාගෙ ග්‍රහනයට නතුකර ගත්තා.වෘකයගෙන් බේරුන පුංච පැටියා අම්මව හොයා ගෙන ඉදිරියට ගියා...

ටික දුරක් යනකොට එළු අම්මා දුටුවා ඉදිරියට එන පුංචිපැටියව..
එළු අම්ම ට තේරුනා මොකක් හරි විපතක් තමයි කියලා.....
ඉක්මනින්ම සිදු වූ දෙය දැනගත් එළු අම්මා හිතුවා මේ වෘකයාට
හොඳ පාඩමක් උගන්වන්න ඕන කියලා.



එළු අම්ම නිවසට යන විට වෘකයා හිටියෙ තදම තද නින්දෙ...
ඉක්මනින හරි බරි ගැහුන එළු අම්මා වෘකය ගෙ බඩ පලලා පුංචි පැටවු
ටික එලියට අරගෙන ගල් කීපයක් බඩට දමලා මැහුවා..
ඊට පස්සෙ එළු අම්මා පැටවු ටිකත් එක්ක ගේ ඇතුලට වෙලා දොර වහගෙන
ආරක්ෂා සහිතව හිටියා.සෑහෙන වෙලාවකට පස්සෙ ඇහැරුනු වෘකයා පිපාසයට
වතුර ටිකක් බොන්න අසල තියෙන ගඟට ඉතා අමාරුවෙන් ගියා...
වතුර බොන්න පහත් වෙනවත් එක්කම ශරීරයේ තියෙන බරට ගඟ ට වැටිලා
මිය ගියා.
ඉන් පසුව එළු අම්ම එයාගෙ පැටවු ත් එක්ක සතුටින් වාසය කළා.